# ධම්මපදයේ අන්තර්ගත අධ්‍යාපන සංකල්පවල ප්‍රායෝගික අගය පිළිබඳ විමර්ශනයක්

විල්ලඹියේ විජිත හිමි.
අධ්‍යාපනවේදී (ගෞරව)
91 / M. Phil / 08

කොළඹ විශ්ව විද්‍යාලයයේ
අධ්‍යාපන පීඨයේ
අධ්‍යාපන දර්ශනපති පශ්චාත් උපාධිය සඳහා
ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය.

UCLIB
453162
CR
University of Colombo Library

1995 අගෝස්තු

# සාරාංශය.

මානව ශිෂ්ටාචාරයේ සමාරම්භයත් සමග ම බිහි වූ ආගම පදනම්කොට ගොඩනැගුණු අධ්‍යාපන පද්ධති, එම ශිෂ්ඨාරයන්හි අඛණ්ඩ පැවැත්ම හා සංවර්ධනය කෙරෙහි ප්‍රබල ලෙස උපස්ථම්භක විය. එබැවින් ආගම සහ අධ්‍යාපනය අතර අන්‍යෝන්‍ය සහව්‍යතාවක් ගොඩනැගුනු අතර ඒවා එකිනෙකට බද්ධව පැවතුණි. එසේම එක් එක් සමාජ අපේක්ෂා කළ පරිදි කිසියම් ආකාරයකින් පුද්ගලයාගේ හා සමාජයේ යහ පැවැත්මට මෙම පද්ධති උපස්ථම්භක විය. එසේ බිහිවී ව්‍යාප්ත වූ බුදු දහම මානව සමාජයේ සියලු අංශයන් හි යහ පැවැත්මට උපකාරී වන විශිෂ්ඨ අධ්‍යාපන පද්ධතියක් ලෙස හැඳින්වීම වඩාත් උචිත ය.

බුදු හිමියන්ගේ ඇවෑමෙන් පසු පවත්වන ලද, ප්‍රථම සංගායනාවේදී සංගීති කාරකයන් විසින් මුල් බුදු සමයට අයත් කෘතින්ගෙන් උපුටා ගත් ගාථා ඇතුළත් කර සංග්‍රහ කරන ලද ඛුද්දක නිකායානුගත ධම්මපදය, මූලික බුදු සමයේ සාරාංශය අන්තර්ගත ඓතිහාසික කෘතිය කි. බුදු හිමියන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර විසින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එන ලදු ව පසු කාලයේ ලංකාවේ දී ලේඛන ගත කරන ලද ධම්මපදය, දේශීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද ව්‍යාප්ත වූව කි. බෞද්ධයාගේ මාර්ගෝපදේශී අත්පොතක් ලෙස දීර්ඝ කාලයක් තිස්සේ භාවිතා වන මෙම ග්‍රන්ථය අතීතයේ සිට වර්තමානය දක්වා ම ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂෙත්‍රය කෙරෙහි පුළුල් ලෙස බලපාන්න කි.

පුද්ගල සංවර්ධනය කේන්ද්‍ර ගත ව සමාජ සංවර්ධනය තුළින් මානවයාගේ යහ පැවැත්මට උපස්ථම්භක වන බුදු දහමෙහි, නූතන ලෝකයට අවශ්‍යව පවත්නා අධ්‍යාපන සංකල්ප බහුල වශයෙන් අන්තර්ගත ය: එබැවින් ආගමකටත් වඩා විශ්ව අධ්‍යාපන පද්ධතියක් ලෙස අර්ථ දැක්වීම වඩාත් යුක්ති සහගත ය. සමාජ යහ පැවැත්ම කෙරෙහි බල පවත්වන පුද්ගල තීරණයන්ට පාදක වන සාධක මැනවින් සංජානනය කෙරෙන බුදු දහම, අධ්‍යාපනය තුළින් සංවර්ධිත පුද්ගලයෙකු බිහි කිරීම පරමාර්ථ කර ගනී.

University of Colombo Library

කවර අධ්‍යාපන ක්‍රමයක වුවද සාර්ථකත්වයට හා කාර්යක්ෂමතාවට, පුද්ගල සංකල්පය සංජානනය කෙරෙන ආකාරය පාදක වේ. බුදු දහමෙහි දැක්වෙන නාම රූප සංකල්පය අනුව පුද්ගලයා යනු, විශ්වමය භෞතික ශක්තීන්ගේ හා භෞතික නොවන අනන්‍ය වූ ක්‍රියා සන්තතියක සංකලනය කි. **අත්ත** සංකල්පයෙන් ප්‍රකට කෙරෙන මෙම සංයුතිය, ගතිකය. **නාම කාය** හා **මනෝමය කාය** ප්‍රවේශ දෙකකින් විශ්ලේෂණය කෙරෙන භෞතික නොවන ක්‍රියා සන්තතියට පුද්ගල සංකල්පයේ සුවිශේෂ ස්ථානයක් හිමි වේ. **සිත** යනු නූතනයේ දී මෙයට සම්පාර්ථයක් දෙන සංකල්පය යි.

මිනිස් සිතෙහි ස්වභාවය හා ක්‍රියාකාරිත්වය අතිශයින් සංකීර්ණ වූවකි. ක්‍රියාකාරී බල ප්‍රභවය වන තෘෂ්ණාව කේන්ද්‍ර කොට ගොඩනැගෙන **ඕඝ, ආසව, සංයෝජන, කිලේස, මාර, පඤ්ච නීවරණ** සංකල්ප වලින් ප්‍රකට කෙරෙන, අගෝචර මනෝභාව පුද්ගලයා වැරදි තීරණවලට යොමු කරමින්, පුද්ගලයාගේත් සමාජයේත් යහ පැවැත්මට ප්‍රතිරෝධී චර්යා රටා ජනිත කරවයි. අගෝචර මනෝභාව ක්ෂය කෙරෙන, **මෙත්තා, මුදිතා, කරුණා, උපෙක්ඛා** යන ගෝචර මනෝභාව වර්ධනය තුළින්, තමාගේ සහ අන්‍යයන්ගේ යහ පැවැත්මට හිතකාමී තීරණ ද, එයට අනුකූල වන චර්යා රටාව ද සංවිධානය වෙයි.

කවර අධ්‍යාපන ක්‍රමයක් තුළින් වුවද අපේක්ෂා කෙරෙනුයේ පුද්ගල සංවර්ධනය යි. සෑම පුද්ගලයෙකුට ම උපරිම මට්ටම දක්වා සංවර්ධනය විය හැකි බව බෞද්ධ අධ්‍යාපන ක්‍රමයෙන් ප්‍රකට කෙරේ. එහෙත් මනෝභාව සංයුතිය අනුව, පුද්ගල සංවර්ධන නැඹුරුව ද විවිධ ය. **පමාද** සංකල්පයෙන් සංවර්ධනයට යොමු නො වූ, ශිෂ්‍යයා ද, **අප්පමාද** සංකල්පයෙන් සංවර්ධනයට යොමු වූ ශිෂ්‍යයා ද ගම්‍ය වේ. **අරහත්ත** සංකල්පයෙන් සංවර්ධිත පුද්ගල ස්වභාවය නිරූපණය කෙරේ. මෙම වර්ගීකරණය තව දුරටත් විශ්ලේෂණය කර ගොඩ නගන නිර්ණායක මගින් පුද්ගල සංවර්ධන ප්‍රවණතාව පහසුවෙන් ම සංජානනය කළ හැකි ය.

පුද්ගලයා සංවර්ධන මාර්ගයට යොමු කිරීම කෙරෙහි බල පවත්වන ප්‍රධාන සාධකයක් වනුයේ ආකල්ප යි. අධ්‍යාපන පද්ධතියේ වැදගත් ම භූමිකා වන, ගුරුවරයා

හා ශිෂ්‍යයා තුළ ස්වකීය සහ අන්‍යෝන්‍ය කාර්ය භාරය කෙරෙහි බල පවත්වන ආකල්ප එම පද්ධතියේ කාර්යක්ෂමතාව තීරණය කෙරෙන සාධකය කි. අධ්‍යාපනය තුළින් භෞතික ප්‍රතිලාභය ම අපේක්ෂා නොකිරීම, හා ඉගෙනීම යනු **ගවේෂණය** හා එහි අන්තර්ගත **පස්ස, අනුපස්සනා, අනුවිචින්තය, අවෙක්ඛණ** ආදී පියවරවලින් සමන්විත **මනසිකාර ප්‍රයත්නය** තුළින් ඉටු කර ගත යුතු ස්වයං ක්‍රියාදාමය කි යන්න ශිෂ්‍ය ප්‍රවේශයෙන් අවධාරණය කෙරෙන ප්‍රබල ආකල්ප වේ. එසේ ම ගුරුවරයා ද ශිෂ්‍යයාගෙන් ප්‍රතිලාභ අපේක්ෂා නො කළ යුතු අතර, අවශ්‍ය දැනුමින් පරිපූර්ණ ව, ආදර්ශවත් ව, ශිෂ්‍යයා කෙරෙහි සානුකම්පිත හැඟීමෙන් යුතුව, අනුද්දයාව, අනුකම්පාව පෙරදැරිව ඉගැන්වීම යනු **මඟ පෙන්වීම** යන ආකල්පයෙන් සිය කාර්ය ඉටු කළ යුතු බව ප්‍රකට කෙරේ.

අධ්‍යාපන ක්‍රියාදාමයේ වැදගත්ම පියවර වනුයේ සංවර්ධනය සඳහා පුද්ගලයාට මග පෙන්වීම යි. ශිෂ්‍යයාගේ මනසිකාර ප්‍රයත්නය උචිත දිශාවකට යොමු කර වේගවත් කිරීමට සහය වීම මඟ පෙන්වන්නාගේ කාර්යය වේ. එමගින් **ගවේෂණය**ට දිරි දිය යුතු ය. ඒ සඳහා අවශ්‍ය ඉගෙනුම් අත්දැකීම් සංවිධානය, ප්‍රවේශ ශිල්පීය ක්‍රම බෞද්ධ අධ්‍යාපන සංකල්පවලින් ප්‍රකට කෙරේ. එසේම ඒ සඳහා උචිත විවිධ ඉගැන්වීම් ක්‍රම, උපාය මාර්ග හා ඇගයීම් ක්‍රම ද මෙම සංකල්පවල අන්තර්ගත වේ. නූතනයේ පවත්නා කවර අධ්‍යාපන ක්‍රමයකටත් වඩා මෙම මග පෙන්වීම් උපාය මාර්ග කාර්යක්ෂම ය. ප්‍රායෝගික ය.

සමස්තයක් ලෙස සලකා බැලීමේ දී, බෞද්ධ අධ්‍යාපන සංකල්පවලින් න්‍යායික, ප්‍රායෝගික හා උපාය මාර්ගික වශයෙන් එකිනෙක තදනුබද්ධව පවත්නා විශිෂ්ඨ අධ්‍යාපන පද්ධතියක් ප්‍රකට වේ. නූතන ලෝකයේ පවත්නා කවර අර්ථ සීමනයකටත් වඩා මෙම සංකල්පවලින් ඉදිරිපත් කෙරෙන විවරණ අද්විතීය වේ. එසේම ජාති, ආගම්, දේශ, කාල ආදී සියලු සීමාවන් ඉක්මවා යන විශ්ව සාධාරණ ගුණයෙන් පරිපූර්ණ ය. නූතන ලෝකයේ පන්ති කාමරයෙන් ආරම්භ ව, ව්‍යාප්ත වන අර්බුද සමනය කර ගැනීම සඳහා විශ්ව සාධාරණ බෞද්ධ අධ්‍යාපන සංකල්පවලින් ප්‍රබල

මහ පෙත්වීමක් සිදු කෙරේ. එසේම වර්තමානයේ අත්‍යවශ්‍යව පවත්නා දේශීය අධ්‍යාපන ආකෘතියක් ගොඩ නැංවීමට හා සංවර්ධනය කිරීමට එමගින් ලද හැකි පිටුවහල ද සීමා රහිත ය. ඒ අනුව නූතන ලෝකයේ කවර අධ්‍යාපන ක්‍රමයකවත් නො පවත්නා තරමේ විශිෂ්ඨ සංකල්ප පද්ධතියක් ලෙස හැඳින්විය හැකි බෞද්ධ අධ්‍යාපන සංකල්ප, මානව සමාජ ප්‍රවර්ධනය සඳහා උපයෝගි කරගැනීම ට කිනම් අධ්‍යාපන ක්‍රමයක් වුව ද අවධානය යොමු කිරීම උචිත ය.

❖❖❖❖❖